දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**

**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/4/28/2019

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2020 ජනවාරි මස 04 වැනි දින


රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 02/2020

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම.</u>**

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා ගැනීම සඳහා ඉල්ලීම් කිරීමේ දී පහත සඳහන් කරුණු අනුව කටයුතු කරන මෙන් ඔබට දැන්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

I. කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කළ වහාම පරිපාලන බලධාරියා වෙත කාර්යක්ෂමතා කඩඉම සඳහා සහන ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම ඉදිරිපත් කිරීම අදාළ නිලධාරියාගේ වගකීම වන බව,

II. ඒ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා දීම අතීතයට බලපාන පරිදි සිදු කරන බැවින් ද, ඒ මත අතීතයේ දී අහිමි වූ අවස්ථා පිළිබඳව වර්තමානයේ දී කටයුතු කළ නොහැකි බැවින් ද අතීතයේ ගත් තීරණයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු බැවින් ද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ලබා ගැනීම මත පහත දක්වා ඇති අහිමි වූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බැලීමට අවකාශ නොමැති බව,

(අ). සහනය ලබා ගැනීමට පෙර, එම කාලයට අදාළව වැටුප් වර්ධක විලම්භනයක් හේතුවෙන් වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් සඳහා වූ තරඟ විභාගයන්ට/ සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා (පුරප්පාඩු නොසළකා ලබා දෙන ශ්‍රේණි උසස්වීම් හැර)

(ආ). සහන කාලය ලබා ගැනීමට පෙර, එම කාලයට අදාළව සිදු වූ වැටුප් වර්ධක විලම්භනයක් හේතුවෙන් අහිමි වූ තනතුරු ලබා ගැනීම සඳහා සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

(ඇ). සහන කාලය ලබා ගැනීමට පෙර, එම කාලයට අදාළව සිදු වූ වැටුප් වර්ධක විලම්භනයක් හඳුනා නොගෙන හෝ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැළකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලබා නොදුන් නිලධාරීන් විසින් එම ලබා නොදුන් පත්වීම හෝ වරප්‍රසාදය ලබා ගැනීමට ඉදිරිපත් කරන අභියාචනා

III. සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පටිපාටියට අනුව නියමිත කාලය තුල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සියළුම පරිපාලන බලධාරීන් විසින් සිදු කළ යුතු බව මෙන්ම නියමිත කාලය තුල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කර ගැනීම සියළු නිලධාරීන්ගේ ද වගකීමක් වන බව,

02. එමෙන්ම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා සහන ඉල්ලුම් කිරීමට නිලධාරීන්ට අවකාශ සැලසෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2011 හා අනුෂාංගික චක්‍රලේඛයන් හි පවතින තත්ත්වයන් යටතේ පමණක් වන බව ද අවධාරණය කරමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව